**(අනෙකුත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය නිලධාරීන්**
**/ බාහිර පුද්ගලයින් සඳහා)** අවසන් දිනය – **2026.09.17**

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි පහත තනතුර සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පත්වීම් 2026.03.28 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි විධිවිධානවලට යටත් වේ.

| **ව්‍යාපෘති වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන)** | **ව්‍යාපෘතියේ නම** | **තනතුරු නාමය** | **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 අනුව සඳහන් කළ කාණ්ඩය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| ඇ. ඩො. මිලියන 25 ට වැඩි සහ ඇ. ඩො. 200 ට අඩු හෝ ඊට සමාන කාණ්ඩයක් | බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රතිස්ථාපන සහකාර | MN 4 -2025<br>53,060 -2x800-<br>(මූලික පියවර හා උපලේඛන III අනුව)<br>හෝ<br>MN 2 -2025<br>48,470-2x540 –<br>( මූලික පියවර හා උපලේඛන III අනුව ) | 01 |

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 අනුව ප්‍රතිස්ථාපන සහකාර (සහායක කාර්ය මණ්ඩලය) MN 4-2025/ MN 2-2025 තනතුරෙහි (ඇ.ඩො. මිලියන 25 - 200 කාණ්ඩය) මූලික සුදුසුකම් පහත දැක්වේ.**

**<u>01. ප්‍රතිස්ථාපන සහකාර (MN-4 - 2025)</u>**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්

  සමඟ

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද (එම තනතුරෙහිම)

Gazette.lk

## 02. ප්‍රතිස්ථාපන සහකාර (MN-2 - 2025)

- භාෂාව, ගණිතය ද ඇතුළුව විෂයන් හතරකට (4) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 6කින් එක් වරක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සහ

- අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරක දී සියලුම විෂයන්ගෙන් සමත් වීම

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද (එම තනතුරෙහිම)

**ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 ට අනුව, කළමනාකරණ සහකාර (සහායක කාර්ය මණ්ඩලය) MN 2-2025 (ඇ.ඩො. මිලියන 200 ට වැඩි කාණ්ඩය) මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**සාමාන්‍ය කොන්දේසි:**

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.

- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.

- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර අදාළ ලේඛනවල සියලුම පිටපත් යැවිය යුතුය.

- අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් ප්‍රදේශයේ සහ/හෝ රටේ ඕනෑම ස්ථානයක වැඩ කිරීමට එකඟ විය යුතුය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් අය සඳහා අවුරුදු 64 ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. රැකියා කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ලබාදෙන අතර, ආරම්භයේදී වසරක කාලයක් සඳහා ලබා දේ. සේවා අවශ්‍යතාවය සහ කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිය
- අයදුම්කරු දැනටමත් පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් කර ඇති නිදහස් කිරීමේ පදනම සහ සලකා බැලීමේ නිවැරදි නිදහස් කිරීමේ පදනම මත පදනම් වේ.

Gazette.lk
AMBITIONS REALIZED

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

- පත්වීම ලබා දීම හෝ නොදීම, සේවා දීර්ඝ කිරීම් ලබා දීම චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධානයන්ට අනුකූලව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි තීරණය වේ.

**04.** **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය ඇතිව එවිය යුතුය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**05.** **අයදුම්පත ඉදිරිපත් කිරීම**

පහත දක්වා ඇති ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ විස්තරාත්මක පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිඛිතව සඳහන් කර, **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක: 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට **2026.09.17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න

**06.** **විශේෂ අවධානය සඳහා**

- **ලබා දී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- **අයදුම්පත සමඟ සහතික පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.**

**07.** **ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - 011-2271048**

**08.** **සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කර ඇති මෙම දැන්වීමේ භාෂා පාඨ අතර යම් නොගැලපීමක් තිබේ නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්වෙනු ඇත.**

සහාය කාර්ය මණ්ඩලය සඳහා අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

Gazette.lk